" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
සාමාන්‍ය දුරකථන / பொதுத் தொலைபேசி / General Telephone - 011 - 2093000

ISO 9001 · SLAB ACCREDITED · ISO/IEC: 17021 QMS-001-01

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/30-38/FI/2024 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2024 .02. 26 |

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරී,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරී,

**මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.**

උක්ත කරුණට අදාලව පහත සඳහන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2024.02.21 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2024 | 2024 රාමසාන් සමයේදී විශේෂ නිවාඩු ලබා දීම |

02. මෙම චක්‍රලේඛයේ පිටපතක් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර ඇති අතර, එකී චක්‍රලේඛය පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානින් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

එස්.එම්.එච්.කුසුම්සිරි,
පරිපාලන නිලධාරී (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 04/2024

මගේ අංකය : EST-6/03/LEA/3125
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2024.02.02

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## 2024 රාමලාන් (රාමසාන්) සමයේ දී විශේෂ නිවාඩු ලබා දීම

මෙවර රාමලාන් (රාමසාන්) සමය 2024 මාර්තු 12 දින ආරම්භ වී 2024 අප්‍රේල් 11 දින අවසන් වීමට නියමිත බැවින්, එම කාලසීමාව තුළ දී මුස්ලිම් නිලධරයන්ට යාඥා සහ ආගමික වතාවත්වල නිරත විය හැකි වන පරිදි වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

02. යාඥා සහ ආගමික කටයුතු දිනපතා සිදුකෙරෙන කාලවේලාවන් පහත දැක්වෙන පරිදි වේ.

* පෙරවරු 03.30 සිට පෙරවරු 06.00 දක්වා
* පස්වරු 03.15 සිට පස්වරු 04.15 දක්වා
* පස්වරු 06.00 සිට පස්වරු 07.00 දක්වා
* පස්වරු 07.30 සිට පස්වරු 10.30 දක්වා

03. හැකි සෑම අවස්ථාවක දී ම එම නිලධරයන්ට ආගමික වතාවත්වල යෙදීමට හැකිවන පරිදි වැඩමුර සකස් කර දිය යුතු ය. නොවැළැක්විය හැකි අවස්ථාවල දී පමණක් විශේෂ නිවාඩු අනුමත කිරීම මැනවි.

04. රාමලාන් (රාමසාන්) අවසන් වීමට දින 14කට කලින් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සුදුසුකම් ඇති මුස්ලිම් නිලධරයන්ට උත්සව අත්තිකාරම් ලබා දීමට ද කරුණාකර කටයුතු කරන්න.

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 0112-699399
ෆැක්ස් : 0112-692158
විද්‍යුත් ලිපිනය : ade-vi@pubad.gov.lk